# ඔබේ දරුවා සයිබර් අවකාශයේ ආරක්ෂිතද?




SRI LANKA CERT|CC

SRI LANKA COMPUTER EMERGENCY READINESS TEAM (SRI LANKA CERT)

තාක්ෂණ අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Technology


අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

# ඵලදායී ව හා ආරක්ෂාකාරී ව අන්තර්ජාලය භාවිතයට දරුවන් හුරු කරමු.

සයිබර් අපරාධ දිනෙන් දින වර්ධනය වෙමින් පවතින නමුත් අන්තර්ජාලය මේ වන විට අත්‍යවශ්‍ය මෙවලමක් බවට පත්ව ඇති බැවින් ආරක්ෂාකාරීව හා ඵලදායී ව අන්තර්ජාලය භාවිතයට දරුවන් හුරුකිරීම කාලීන අවශ්‍යතාවකි.

අන්තර්ජාලය භාවිතා කරන්නන්ගේ පෞද්ගලික තොරතුරු සොරකම් කිරීම, මූල්‍ය වංචා, සයිබර් හිංසන (Cyber Bullying) ආදිය සයිබර් අපරාධවලට උදාහරණ කිහිපයකි.

ඒ අනුව දෙමාපිය/වැඩිහිටි අධීක්ෂණය යටතේ අන්තර්ජාල භාවිතයට සිසුන් යොමුකිරීම මගින් සිසුන්ගේ  ආරක්ෂාව තහවුරු කිරීම මෙහි අරමුණයි. ඒ සඳහා ගුරුවර, දෙමාපිය, වැඩිහිටි දැනුවත්භාවය වර්ධනය කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශාඛාව සහ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය එක්ව මෙම ප්‍රකාශනය නිකුත් කරන ලදී.



# සයිබර් අවකාශයේ දී දරුවන් මුහුණපාන තර්ජන හා අභියෝග

සිසුන්ට දැනුම, කුසලතා වර්ධනයට සහ සන්නිවේදන ක්‍රියාකාරකම් සදහා පිවිසීමට පහසුකම් සපයන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත ප්‍රධාන මෙවලමක් ලෙස අන්තර්ජාලය හැදින්විය හැකිය.එහෙත් ආරක්ෂාකාරී නොවන අයුරින් අන්තර්ජාලය භාවිතය අනතුරුදායක වන අතර ගැටලු සහ අපහසුතාවලට මගපාදයි.


මෙවැනි ගැටලු සදහා උදාහරණ කිහිපයක් පහත දක්වා ඇත.

1. නුසුදුසු වෙබ් අඩවි පරිශීලනය මගින් ළමා මනස විකෘති වීම.

2. සමාජ මාධ්‍ය භාවිතයෙන් අනවශ්‍ය සබදතා ඇතිකර ගැනීම.

3. දරුවන්ගේ පෞද්ගලික සහ අනන්‍යතා තොරතුරු සොරකම් කිරීම.





4. දරුවන් මාර්ගගත අපයෝජනයට ලක්වීම සහ සයිබර් හිංසනයේ ගොදුරු බවට පත්වීම.





5. දරුවන් පරිගණක ක්‍රීඩා, චිත්‍රපට ආදී අනවශ්‍ය ලෙස කාලය නාස්තිවන පරිගණක ක්‍රියාකාරකම් සඳහා අසීමාන්තික ලෙස ඇබ්බැහිවීම තුළින් මානසික සෞඛ්‍යය පිරිහීම

# අන්තර්ජාලය ආරක්ෂිතව භාවිත කිරීමට උපදෙස් 10ක්




1. ඔබේ දරුවා අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය භාවිත කරන සෑම විටම අවධානයෙන් සිටින්න.

2. නාදුනන තැනැත්තන්ගෙන් ලැබෙන මිතුරු ඇරයුම්, වීඩියෝ ඇමතුම්, කෙටි පණිවුඩ, විද්‍යුත් තැපැල් ආදිය පිළිබඳව නිබඳ සැලකිලිමත් වන්න.




3. සමාජමාධ්‍ය මිතුරන් ඇතිකර ගැනීම හා තොරතුරු හුවමාරුව සම්බන්ධයෙන් දරුවන්ගෙන් කාරුණිකව විමසන්න. එසේම තමන්ගේ පින්තූර හා වීඩියෝ පළ කිරීම හා හුවමාරු කිරීම සිදු නොකරන ලෙස දරුවන් දැනුවත් කරන්න.

4. දෙමාපියන් තම දරුවන්ගේ අන්තර්ජාල ගිණුම් වල පරිශීලක අනන්‍යතා සහ මුරපද පිළිබඳව දැනුවත් විය යුතු අතර සුදුසු ආරක්ෂිත උපක්‍රම ඇතුළත් කිරීමට (multi factor authentication) වගබලා ගත යුතු ය.






5. අන්තර්ජාලයට සම්බන්ධ වන සියලු උපාංග සඳහා ප්‍රති වෛරස මෘදුකාංග, ශක්තිමත් මුරපද ඇතුළු ආරක්ෂිත ක්‍රමවේද ඇතුළත් කරන්න. (මෙහි දී උපාංගයට,අන්තර්ජාලයට පිවිසීමට මෙන්ම සුවිශේෂී ගොනු ආදියට වෙන වෙනම මුරපද / ආරක්ෂිත උපක්‍රම යෙදිය හැකිය.)

6. මාර්ගගත අධ්‍යන පිවිසීම් සඳහා භාවිතා කරන පරිශීලක නාම, මුරපද සහ අනන්‍ය සබැඳි අන් අයට හෙළි නොකරන්න

7. ඔබේ සහ ඔබේ දරුවාගේ පෞද්ගලිකත්වය සහ ඩිජිටල් අනන්‍යතාව හෙලිවන තොරතුරු සමාජ මාධ්‍ය හා අනෙකුත් වෙබ් අඩවිවල පළ කිරීමෙන් වළකින්න. Facebook, Google, WhatsApp, TikTok, Viber ආදියෙහි මීට අදාළ සැකසුම් (settings) පවතී.




8. අන්තර්ජාල සේවා සැපයුම්කරුවන්ගේ නිර්දේශ මත හඳුන්වා දී ඇති විශේෂිත යෙදවුම් දරුවන්ගේ සයිබර් ආරක්ෂාව සඳහා සුදුසු පරිදි භාවිතා කරන්න.

9. පරිගණකය නිවසේ සැමට දර්ශනය වන පරිදි සහ සහාය ලබා දිය හැකි ස්ථානයක තබන්න.අන්තර්ජාලය භාවිතා කරන කාලය සීමා කරන්න. සෑම විටම දරුවන් ආරක්ෂාකාරී අන්තර්ජාල භාවිතයට යොමුකරන අතරම එළිමහන් ක්‍රීඩා ආදී ක්‍රියාකාරකම් සඳහා ද යොමු **කරන්න**

10. අන්තර්ජාල අවභාවිතා කිරීමේ සිදුවීමක් සැලවූ වහාම ඒ පිළිබඳ අදාළ පාර්ශ්ව දැනුවත් කරන්න.

# අන්තර්ජාල භාවිතයේදී හිංසනයට හෝ අපහසුතාවකට හෝ පත් වූ විට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

1. අන්තර්ජාල භාවිතයේ දී යම් වරදක් සිදු වී ඇතිබව දැනගත් වහාම දරුවා සමග කතා කරන්න, තරවටු කිරීමෙන් වළකින්න, සහ විසඳුමක් සෙවීමට ඔවුන්ට සහය වන්න.

2. ඔබගේ පෞද්ගලික හෝ පාසලේ හෝ විද්‍යුත් තැපෑල, සමාජ මාධ්‍ය ආදී ගිණුම් වෙත යමෙකු ප්‍රවේශ වී ඇතැයි ඔබට නිරීක්ශණය වන්නේ නම්, වහාම මුරපද වෙනස් කර ගිණුම තාවකාලික ව අත්හිටුවන්න. මේ සදහා, සමාජමාධ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරන්න.

3. අන්තර්ජාල හෝ සමාජමාධ්‍ය අවභාවිතය ආශ්‍රිත ගැටලු වලට ප්‍රතිචාර දැක්වීමේ දී ද්වේශ සහගත හෝ කලහකාරි ලෙස කටයුතු කිරීමෙන් වළකින්න.




4. සයිබර් ආරක්ෂණයට අදාළ මෙවැනි ගැටලු සඳහා තාක්ෂණික විසඳුම් ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය මගින් ලබාගත හැකිය. වෙබ් අඩවි
www.cert.gov.lk/, https://www.onlinesafety.lk/
කෙටි දුරකථන අංකය 101

5. නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමට අවශ්‍ය වන්නේ නම් ශ්‍රී ලංකා පොලිස් සයිබර් අපරාධ අංශය සම්බන්ධ කරගන්න.

6. පාසලේ ගැටලුවක් ඇත්නම් අදාළ ගුරුවරුන් දැනුවත් කරන්න. අවශ්‍ය වන්නේ නම් ශ්‍රී ලංකා ළමා ආරක්ෂක අධිකාරිය සම්බන්ධ කරගන්න.
(කෙටි දුරකථන අංකය : 1929 )







## ඔබගේ දුවා දරුවන්ගේ සයිබර් ආරක්ෂාව වෙනුවෙන් ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයෙන් පිදෙන තිළිණයකි

සයිබර් ආරක්ෂාව සම්බන්ධ ගැටලුවකදී ශ්‍රී ලංකා සර්ට් (Sri Lanka CERT) ආයතනයට දුරකථන ඇමතුමක් ලබාදීමට පසුබට නොවන්න.


**කාර්යාල ලිපිනය**

**ශ්‍රී ලංකා සර්ට් ආයතනය**
කාමර අංක 4-112,
BMICH,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

වෙබ් : https://www.cert.gov.lk
https://www.onlinesafety.lk

email : report@cert.gov.lk



SRI LANKA CERT|CC
SRI LANKA COMPUTER EMERGENCY READINESS TEAM (SRI LANKA CERT)

තාක්ෂණ අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Technology

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education